සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

# බුද්ධ ධර්මය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි.

- සියලූ ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. සිදුහත් බෝසතාණන් වහන්සේ දේවාරාධනය ලැබීමෙන් පසු තමාගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම හඳුන්වන්නේ,
(1) සමතිංස පෙරුම්දම් පිරීම නමිනි. (2) පංචමහා ස්වප්නයයි.
(3) චතුරාංග සමන්නාගත වීර්යයි. (4) පංච මහා විලෝකනය නමිනි.

02. සිදුහත් කුමාරයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන් වූ බමුණු පඬිවරයා,
(1) කොණ්ඩඤ්ඤ නම් වේ. (2) කාලදේවල නම් වේ.
(3) සර්වමිත්‍ර නම් වේ. (4) සුයාම නම් වේ.

03. සිදුහත් බෝසතුන්ගේ අනූපමේය රූපශ්‍රීය හා ශාන්ත බව දැක ''මෙවැනි ස්වාමියෙක් ඇති බිරිය ද නිවීම ලැබ සිටින්නියකි'යි'' ප්‍රකාශ කළේ,
(1) භද්දකච්චානා විසින් යසෝදරාව පිළිබඳව ය.
(2) කිසාගෝතමිය විසින් භද්දකච්චානා පිළිබඳව ය.
(3) ප්‍රජාපතිය විසින් කිසාගෝතමිය පිළිබඳව ය.
(4) රාහුල මාතාව විසින් මහාමායා දේවිය පිළිබඳව ය.

04. ''රහසත් පව් නොකොට - කෙළෙසරයනුත් දුරුකොට....'' යන බුදුගුණාලංකාරය නැමති ග්‍රන්ථයේ දී වර්ණනා කරන්නේ බුදුරජාණන් වහන්සේගේ කිනම් බුදු ගුණය ද?
(1) සම්මා සම්බුද්ධ බුදු ගුණය (2) භගවා බුදු ගුණය
(3) අරහං බුදු ගුණය (4) ලෝකවිදූ බුදු ගුණය

05. තමා විසින් ම පිළිපැද, ඇස් පනාපිට මොළොවදී ම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්මය,
(1) සන්දිට්ඨිකයි. (2) අකාලිකයි. (3) ඕපනයිකයි. (4) ඒහිපස්සිකයි.

06. තෙරුවන් ගුණ අතරින් සද්ධර්මයේ ගුණ ගණන,
(1) නවයකි. (2) විසි හතරකි. (3) දොළහකි. (4) හයකි.

07. භික්ෂූන් වහන්සේලාගේ (මහා සංඝරත්නය) දෛනික කාර්යයන් සිදුවන්නේ විනය ශික්ෂාවන්ට අනුකූල ව මනා වූ පිළිවෙත් පුරමින් ය. එසේ හෙයින් මහ සඟරුවන,
(1) උජුපටිපන්න නම් වේ. (2) සුපටිපන්න නම් වේ.
(3) ඤායපටිපන්න නම් වේ. (4) සාමීචිපටිපන්න නම් වේ.

08. ''ස්වාමිනී, මම බොහෝදේ පාඩම් කර ඇත්තෙමි. එහෙත් දැන් ඒවා මතකයට නගාගත නොහැකි ය. එයට හේතුව කුමක්දැයි'' එක්තරා බ්‍රාහ්මණයෙක් ඇසූ පැනයට බුදුරජාණන් වහන්සේ උපමා මගින් පැහැදිලි කර දුන්නේ මොනවා ද?
(1) පංචනීවරණයන් ය. (2) පංච උපාදානස්කන්ධයන් ය.
(3) පංචේන්ද්‍රියන් ය. (4) පංච මහා විලෝකනයන් ය.

09. සිතෙහි කයෙහි නිදිමත ගතිය, උදාසීනකම පැවතීම, මතකයට නෙඒම, නිදිබර බව, උදාසීනකම ආදිය පවතින්නේ,
(1) කාමච්ඡන්දය නිසා ය. (2) ව්‍යාපාදය නිසා ය.
(3) ථීනමිද්ධය නිසා ය. (4) විචිකිච්ඡාව නිසා ය.

10. ඉන්ද්‍රිය සංවරය සතිසම්පජඤ්ඤය, සන්තුට්ඨිතා ආදී ගුණාංගවල පිහිටා ප්‍රගුණ කළ යුතු භාවනාව නම්,
(1) ත්‍රිලක්ෂණ භාවනාවයි. (2) ප්‍රඥා භාවනාවයි.
(3) විදර්ශනා භාවනාවයි. (4) සමථ භාවනාවයි.

11. සමාධි හෙවත් චිත්ත භාවනාව බුදුරජාණන් වහන්සේ ලොව පහළවීමට පෙර භාරතීය යෝගීන් අතර භාවිත වූවකි. මෙහි උසස් ම ප්‍රතිඵල ලෙස පංච අභිඥා, අෂ්ට සමාපත්ති උපදවාගත හැක. බුද්ධ කාලයට පෙර එසේ සිටි අෂ්ට සමාපත්තිලාභියකු වන්නේ,
(1) භාර්ගව තවුසා ය. (2) උද්දකරාම තවුසා ය.
(3) ආලාරකාලාම තවුසා ය. (4) කොණ්ඩඤ්ඤ තවුසා ය.

12. බුදුරජාණන් වහන්සේ ආර්ය මාර්ගය අනුගමනය කළ හෙයින් ද නිර්වාණයට සැපත් වූ හෙයින් ද, යහපත් වචන ඇති හෙයින් ද බුදුරජාණන් වහන්සේ,
(1) සුගත නම් වන සේක. (2) භගවා නම් වන සේක.
(3) සත්ථා නම් වන සේක. (4) බුද්ධ නම් වන සේක.

13. සිල් රැකීමෙන් ලැබෙන ආනිශංස ධර්මයෙහි දක්වා තිබේ. එසේ සිල් රැකීමෙන් ලැබෙන ආනිශංසයක් <u>නොවන්නේ</u>,
(1) කීර්තිය පැතිරීම. (2) මහත් වූ භොග සම්පත් අත්කර ගැනීම.
(3) සිහි මුලා වී කලුරිය කිරීම. (4) මරණින් මතු දුගතියෙහි ඉපදීම.

14. ''මහණෙනි මම කුසලය නම් කුමක්දැයි සොයන සුලු වූයෙමි. මගධ දනව්වෙහි පිළිවෙළින් සැරිසරන්නෙමි. උරුවේලයෙහි සේනානි ගම වෙත පැමිණියෙමි....'' ආදී වශයෙන් නේරංජනා නදිය ආශ්‍රිත ව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. මෙම පාඨ සඳහන් සූත්‍රය වන්නේ,
(1) ධම්මචක්කපවත්තන සූත්‍රයකි. (2) වේළුද්වාර සූත්‍රයයි.
(3) වීමංසක සූත්‍රයයි. (4) අරියපරියේසන සූත්‍රයයි.

15. ක්‍රෝධය උපන්විට වෛරය උපදී. ක්‍රෝධය නිවී ගිය විට වෛරය ද සංසිඳෙයි. මෙම සිදුවීම පිළිබඳ ක්‍රියාත්මක වන ධර්මතාවය දැක්වෙන්නේ,
(1) චතුරාර්ය සත්‍ය ධර්මයෙනි, (2) පටිච්ච සමුප්පාද ධර්මයෙනි.
(3) කර්මය පිළිබඳ ඉගැන්වීමෙනි. (4) වසල ධර්ම කරුණු වලිනි.

16. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමේ දී තමාට මුහුණ දීමට සිදුවන අකුසල කර්ම විපාක පවා මගහරවා ගතහැකි වෙන අවස්ථා විය හැක්කේ,
(1) ප්‍රයෝග සම්පත්තියෙනි. (2) කාල සම්පත්තියෙනි.
(3) උපධි සම්පත්තියෙනි. (4) ගති සම්පත්තියෙනි.

17. ''ගෞතමයන් වහන්ස, අතුළත අවුල් ය. පිටත ද අවුල් ය. සත්ත්ව ප්‍රජාව අවුලෙන් අවුල වෙලී සිටියි. කවරෙක් නම් අවුල් නිරවුල් කරන්නේ ද?'' මෙම ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ ලබාදුන් පිළිතුර කුමක් ද?
(1) ප්‍රශ්නවලට මුහුණ දී අවුල් විසඳිය යුතු ය. (2) ප්‍රශ්න මගහරවා ගත යුතු ය.
(3) සසර දුකින් එතෙර විය යුතු ය. (4) ඉවසීමෙන් කටයුතු කළ යුතු ය.

18. පඤ්ච ස්කන්ධය යනු ?
(1) රූප, වේදනා, තණ්හා, උපාදාන, විඤ්ඤාණ ය.
(2) රූප, වේදනා, සඤ්ඤා, විඤ්ඤාණ, නාමරූප ය.
(3) රූප, වේදනා, තණ්හා, උපාදාන, භව ය.
(4) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ය.

19. සතර මහා භූත රූප ලෙස දහමෙහි දක්වා ඇත්තේ,
(1) ඇස, කන, නාසය, දිව ය. (2) පඨවි, ආපෝ, තේජෝ, වායෝ ය.
(3) රූප, ශබ්ද, ගන්ධ, රස ය. (4) චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා ය.

20. සහජීවනයෙන්, සාමයෙන්, සමගියෙන්, සහයෝගයෙන් ජීවත්වීම බුදු දහම අගයන උසස් ලක්ෂණයකි. ශ්‍රී ලාංකික ජන සමාජයේ සහජීවනයෙන් ක්‍රියාකිරීම සඳහා අදාළ නොවන කරුණ කුමක් ද?
   (1) කිසිම ආගමකට හෝ ජාතියකට හෝ අයහපතක් නොකර සිටීම ය.
   (2) සතර සංග්‍රහ වස්තු සෑම ජන සමූහයන් තුළ පැවතීම ය.
   (3) සෑම ආගමකින් ම උගන්වන්නේ එකම දෙයක් බව පිළිගෙන සියලු ආගම් ඇදහීම ය.
   (4) වෙනත් ආගමික සිද්ධස්ථානවලට ගරු කිරීම හා හානි නොකිරීම ය.

21. සිව් බඹ විහරණ ලෙස සලකනු ලබන්නේ,
   (1) දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය යි.
   (2) සීල, සමාධි, ප්‍රඥා, සමානාත්මතාවය යි.
   (3) දාන, සීල, නෙක්ඛම්ම, ප්‍රඥාව යි.
   (4) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂාව යි.

22. බුදුරජාණන් වහන්සේ පළමු වස්කාලය ගත කළේ කොහේ ද?
   (1) ඉසිපතනාරාමයේ ය.
   (2) රජගහ නුවර ය.
   (3) නිග්‍රෝධාරාමයේ ය.
   (4) උපවර්තන සල් උයනේ ය.

23. බුදුරජාණන් වහන්සේ ඇට්ටේරියා වනයක දී සහ ජීවක අඹ උයනේ දී දේශනා කළ සූත්‍ර ධර්ම වන්නේ,
   (1) ධම්මචක්කපවත්තන සූත්‍රය සහ වේදනාපරිග්ගහ සූත්‍රයයි.
   (2) සිංසපා සූත්‍රය සහ සාමඤ්ඤඵල සූත්‍රයයි.
   (3) කසීභාරද්වාජ සූත්‍රය සහ ධනියගෝපාල සූත්‍රයයි.
   (4) මහා මොග්ගල්ලාන සූත්‍රය සහ මහා සීහනාද සූත්‍රයයි.

24. උස් හඬින් කතා කළහොත් බුදුරජාණන් වහන්සේ තම අසපුවට වැඩම නොකරාවියි යන හැඟීමෙන් තම ශ්‍රාවක පිරිස නිශ්ශබ්ද කරගනු ලැබුවේ,
   (1) සංජය පිරිවැජියා ය.
   (2) අචේල කස්සප පිරිවැජියා ය.
   (3) පොට්ඨපාද පිරිවැජියා ය.
   (4) උපක පිරිවැජියා ය.

25. ජේතවනාරාමයට වැඩම කළ භික්ෂු පිරිසක් මහ ශබ්ද නගමින් උස් හඬින් කතා කරමින් සිටින විට බුදුරජාණන් වහන්සේ එම පිරිසට දේශනා කර සිටියේ,
   (1) කෙවුලන්සේ ඝෝෂා නොකොට ආරාමයෙන් පිටව යන ලෙස ය.
   (2) ශබ්ද නොකර නිශ්ශබ්දව සිටින ලෙස ය.
   (3) සමගියම හොඳයි. විවාද නොකර සිටින ලෙස ය.
   (4) අප්‍රමාදීව කටයුතු සලසා ගන්නා ලෙස ය.

26. තමන්ටත්, අනුන්ටත් හානියක් නොවන ආකාරයට සහ පංච වෙළඳාමෙන් තොරව ජීවත්වන ආකාරය පිළිබඳව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ උගන්වනු ලබයි. එම ඉගැන්වීම,
   (1) සම්මා දිට්ඨියයි. (2) සම්මා සංකප්පයයි. (3) සම්මා වායාමයි. (4) සම්මා ආජීවයයි.

27. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථ ගණයට අතුළත් නොවන්නේ,
   (1) සාරාර්ථ සංග්‍රහයයි.
   (2) බුදුගුණාලංකාරයයි.
   (3) මුනිගුණාලංකාරයයි.
   (4) සතර බණවර සන්නයයි.

28. මධ්‍යම ප්‍රතිපදාවේ සමාධි ශික්ෂාවට අයත්වන අංග ඇතුළත් වරණය තෝරන්න.
   (1) සම්මා වායාම, සම්මා වාචා, සම්මා සති
   (2) සම්මා සති, සම්මා දිට්ඨි, සංකප්ප
   (3) සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි
   (4) සම්මා සමාධි, සම්මා කම්මන්ත, සම්මා ආජීව

29. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ධ්‍යාන වැඩීමෙන් සිත පිරිසිදු කිරීම හා සිත එකඟ කර ගැනිමට ඉවහල් කරගත හැකි මාර්ගාංගය වනුයේ,
   (1) සම්මා දිට්ඨියයි. (2) සම්මා වායාමයයි. (3) සම්මා සතියයි. (4) සම්මා සමාධියයි.

30. ජීවිතයේ පුරුද්දක් ලෙස නිතර සිදුකරන ලද කුසලාකුසල කර්ම හඳුන්වනු ලබන්නේ,
   (1) ආචිණ්ණ කර්ම (2) උපත්ථම්භක කර්ම (3) කටත්තා කර්ම (4) ගරුක කර්ම

31. ''මම තරුණවියේ පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේ ද නැත.'' ආදී වශයෙන් පසුතැවීමට හේතුවන බව දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පද දෙක කුමක් ද?
(1) තංච කම්මං කතං සාධු - යං කත්වා නානු තප්පති
(2) අක්කොච්ජිමං බ්‍රහ්මචරියං - අජිනි මං අහාසිමෙ
(3) අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනෙ ධනං
(4) සුජීවං අහිරිකේන - කාකසූරේන ධංසිනා

32. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන ආකාරයට භෝග විනාශයට හේතුවන කරුණු,
(1) හතරක් දක්වා ඇත. (2) හයක් දක්වා ඇත. (3) පහක් දක්වා ඇත. (4) අටක් දක්වා ඇත.

33. ''ස්වාමීනී, ඔබ වහන්සේ දෙවියෙක් ද, ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද, මනුෂ්‍යයෙක් ද'' යන්න පිළිවෙළින් විමසූ බමුණු පඬිවරයා වන්නේ,
(1) ද්‍රෝණ බමුණා ය. (2) සේල බමුණා ය.
(3) හුහුංක බමුණා ය. (4) සෝණදණ්ඩ බමුණා ය.

34. ''කෙලෙස් මල ඇති විවිධාකාර වූ සත්ත්වයින් වසන මේ ලෝකය ද මඩ ජලය පිරුණු පොකුණක් වැනිය. නමුත් බුද්ධාදී උතුමෝ කෙලෙස් මඩ වතුරෙන් ඉහළට නැගී එහි නොගැවී වැඩ වසති.'' මෙම ස්වභාවය උපමා කරනු ලබන්නේ,
(1) මඩ සහිත වතුරකට ය. (2) පද්මාකාර ජීවිතයට ය.
(3) පිරිසිදු වතුරකට ය. (4) අනුසෝතගාමී පිළිවෙතකට ය.

35. ''ඔබ වහන්සේ පැවිදි වූයේ කවරෙකු උදෙසා ද? ඔබ වහන්සේගේ ගුරුතුමා කවරෙක් ද? කාගේ දහමක් ද ඔබ වහන්සේ රුචි කරන්නේ ?'' මෙම ප්‍රකාශය සිදුකරන ලද්දේ කවරෙකු විසින් කා හට ද?
(1) සංජය පිරිවැජියා විසින් කෝලිත පිරිවැජියාට ය.
(2) උපක ආජීවකයා විසින් කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේට ය.
(3) කෝලිත පිරිවැජියා විසින් උපතිස්ස පිරිවැජියාට ය.
(4) උපතිස්ස පිරිවැජියා විසින් අස්සජි මහරහතන් වහන්සේට ය.

36. ''කාම තණ්හාව'' යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) මම නිත්‍ය වශයෙන් දිගින් දිගට ම සසර සැප විඳීම යන්නයි.
(2) පරලොවක් නැතැයි විශ්වාස කිරීමයි.
(3) ඉඳුරන් පිනවීමට ඇති අසීමිත කැමැත්තයි.
(4) ආත්මය පිළිබඳ හැඟීමයි.

37. බුදු දහමට අනුව හටගැනීමේ ස්වභාවය ඇති සෑම දේම නැතිවීමේ ස්වභාවයෙන් යුක්ත වේ. වෙනස්වීමේ ස්වභාවයෙන් යුක්ත වේ. මෙය හඳුන්වනු ලබන්නේ,
(1) අනිත්‍ය ලක්ෂණය ලෙස ය. (2) දුක්ඛ ලක්ෂණය ලෙස ය.
(3) නිත්‍ය ලක්ෂණය ලෙස ය. (4) ආත්ම ලක්ෂණය ලෙස ය.

38. භාවනාවට යොමුවන පුද්ගලයා විසින් ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ඉන්ද්‍රියන් සංවර කර ගත යුතුය. එය ධර්මයේ හැඳින්වෙන්නේ,
(1) සන්තුට්ඨිතා යන නමිනි. (2) ඉන්ද්‍රිය සංවරය නමිනි.
(3) සති සම්පජඤ්ඤය නමිනි. (4) කායානුපස්සනා නමිනි.

39. පරපණ නොනැසීම, සොරකම් නොකිරීම, වැරදි කාම සේවයෙන් වෙන්වීම ආදිය,
(1) සම්මා දිට්ඨියයි. (2) සම්මා සංකප්පයයි.
(3) සම්මා කම්මන්තයයි. (4) සම්මා ආජීවයයි.

40. මෙරට ශාසනික පුනරුදයක් ඇතිකරලීමට සහ උපසම්පදාව නැවත ස්ථාපනය කිරීමට අනුග්‍රහ දැක්වූ රාජ්‍ය පාලකයා වන්නේ,
(1) රාජසිංහ රජතුමා ය. (2) විමලධර්මසූරිය රජතුමා ය.
(3) කිත්සිරිමෙවන් රජතුමා ය. (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය.



(ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

## බුද්ධ ධර්මය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකයː

- පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) (i) සුද්ධෝදන මහ රජතුමාට කුඩා කල ශිල්ප ශාස්ත්‍ර ඉගැන් වූ බමුණු පඬිවරයාගේ නම කුමක් ද?

(ii) ''අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ'' මෙහි අදහස ලියන්න.

(iii) සතර පෙර නිමිති ලියා දක්වන්න.

(iv) බුදු දහමෙහි ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

(v) ''අනුසෝතගාමී'' යන්න අර්ථ දක්වන්න.

(vi) සතර සංග්‍රහ වස්තු නම් කරන්න.

(vii) කුසල මූල තුන ලියා දක්වන්න.

(viii) ''ඉමස්මිං අසති ඉදං න හෝති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති'' මෙහි අර්ථය ලියා දක්වන්න.

(ix) පුද්ගල චරිත අතරින් හතරක් නම් කරන්න.

(x) දුටුගැමුණු මහ රජතුමන් ඉදිකළ ස්තූප දෙක නම් කරන්න.

(02) (i) නැගෙනහිර දිසාව සහ උඩදිසාව නියෝජනය වන සමාජ කණ්ඩායම් දෙක නම් කරන්න.

(ii) දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම්වලින් තුනක් ලියා දක්වන්න.

(iii) පරමාදර්ශී යහපත් සමාජයක් ගොඩනංවාලීම සඳහා ගුරු - ශිෂ්‍ය සබඳතාවය මැනවින් ඉවහල් වෙයි. පහදන්න.

(03) (i) ''උට්ඨානවතෝ සතිමතො'' යන ධම්මපද ගාථාව සම්පූර්ණකර ලියන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට ධම්මපදයෙන් ලැබෙන උපදෙස් ඇගයීමට ලක් කරන්න.

(04) (i) චතුරාර්ය සත්‍යය අතුරෙන් දෙකක් නම් කරන්න.

(ii) ඉහත (i) හි නම් කරන ලද එක් කරුණක් පැහැදිලි කරන්න.

(iii) දෛනික ජීවිතයේ මුහුණ දෙන ගැටලු විසඳාගැනීමට චතුරාර්ය සත්‍ය ඉවහල් කර ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(05) (i) බුදුරජාණන් වහන්සේ ස්වභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන දෙකක් නම් කරන්න.

(ii) බුදුරජාණන් වහන්සේ පරිසර සුන්දරත්වය අගය කළ ආකාරය කෙටියෙන් දක්වන්න.

(iii) ජීවි - අජීවි පරිසරය ආරක්ෂා කර ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න.

(06) (i) පළමු ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා හේතු වූ ආසන්නම හේතුව ලියා දක්වන්න.

(ii) එම සංගායනාව පැවැත්වීමට රාජානුග්‍රහය ලබාදුන් පාලකයා, මූලිකත්වය ගත් මහ රහතන්වහන්සේ, පැවැත් වූ ස්ථානය ලියා දක්වන්න.

(iii) ධර්ම විනයෙහි ආරක්ෂාව පිණිස මෙම ධර්ම සංගායනාව යෙදූ ක්‍රියා පිළිවෙත් ඇගයීමට ලක්කරන්න.

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු මහරජතුමා

(ii) සමථ භාවනාව

(iii) ත්‍රිලක්ෂණය

(iv) සඳකඩ පහණ

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(2) | 4 -(3) | 5 -(1) | 6 -(4) | 7 -(2) | 8 -(1) | 9 -(3) | 10 -(4) |
| 11-(2) | 12 -(1) | 13 -(3) | 14 -(4) | 15 -(2) | 16 -(1) | 17 -(3) | 18 -(4) | 19 -(2) | 20 -(3) |
| 21-(4) | 22 -(1) | 23 -(2) | 24 -(3) | 25 -(1) | 26 -(4) | 27 -(2) | 28 -(3) | 29 -(4) | 30 -(1) |
| 31-(3) | 32 -(2) | 33 -(1) | 34 -(2) | 35 -(4) | 36 -(3) | 37 -(1) | 38 -(2) | 39 -(3) | 40 -(4) |

## II කොටස

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

01. (i) අසිත හෙවත් කාලදේවල තවුසා

(ii) ''මේ මාගේ අවසන් උපතය. නැවත උපතක් නැත.''

(iii) මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිණියක්, පැවිදි රුවක්

(iv) සමථ භාවනාව / විපස්සනා භාවනාව

(v) ගඟක් පහළට ගලායන්නාසේ මිනිසුන් රාගයෙන් රාගයට, ද්වේශයෙන් ද්වේශයට, මෝහයෙන් මෝහයට ගමන් කිරීම.

(vi) දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව

(vii) අලෝභ, අදෝස, අමෝහ

(viii) ''මෙය නැති කල්හි මෙය නොවේ - මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි.''

(ix) රාග චරිත, ද්වේශ චරිත, මෝහ චරිත, සද්ධා චරිත, බුද්ධි චරිත, විතක්ක චරිත

(x) රුවන්වැලි සෑය / මිරිසවැටිය (ලකුණු 2 × 10 = 20)

(02) (i) නැගෙනහිර - මාපිය, දූදරු උඩ දිශාව - ගිහි, පැවිදි

(ii) දරුවන්ගෙන් දෙමාපියන්ට

* මවුපියන් පෝෂණය කිරීම.
* ඔවුන්ගේ කටයුතු සොයාබලා ඉටුකර දීම.
* දෙමාපියන් රැගෙන ආ කුල පරපුර ආරක්ෂා කිරීම.
* දෙමාපියන්ගෙන් හිමි වූ දේ රැක ගැනීම.
* මවුපියන් පරලොව ගිය පසු පින් අනුමෝදන් කරවීම.

(iii) සිගාලෝවාද සූත්‍රයේ දකුණු දිශාවෙන් ගුරු ශිෂ්‍ය යුතුකම් දක්වා ඇත. එසේ ගුරුවරු දකුණු දිශාවට සමාන කර දක්වා ඇත්තේ ශිෂ්‍යයන්ගේ පුද සැලකිලි ලැබීමට සුදුසු වන හෙයින් ය. ගුරුවරයාගෙන් ශිෂ්‍යාටත් ශිෂ්‍යාගෙන් ගුරුවරයාටත් යුතුකම් ඉටුවීම තුළින් පරමාදර්ශී සමාජයක් බිහිවීමට මඟ පෑදේ. ශිෂ්‍යයන් තම ගුරුවරුන් කෙරෙහි විශ්වාසයෙන් ඇල්මකින් ක්‍රියා කළ යුතු ය. ඉගෙනීම ඉතා ඕනෑකමින් උනන්දුවෙන් කළ යුතු ය. ශිෂ්‍යයන කෙරෙහි ගුරුවරයා ද දයාවෙන්, කරුණාවෙන් ක්‍රියා කළ යුතු ය. ශිෂ්‍යයන්ගේ සුළු වරදක් දුටු විට කලකිරීමට පත් නොවී ඔවුනගේ යහපත සඳහා ක්‍රියා කළ යුතු ය. මෙසේ ක්‍රියා කරන විට අන්‍යෝන්‍ය සබඳතාව වර්ධනය වී එය පරමාදර්ශී සමාජයක් බිහි කිරීමට මඟ පාදයි.

(ලකුණු 2 + 3 + 5 = 10)

(03) (i) උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති

(ii) උත්සහවන්ත, මනා සිහිය ඇති නිවැරදි දේ පරීක්ෂාවෙන් හික්මීමෙන්, දැහැමිව ජීවත් වන තැනැත්තාගේ යසස වැඩේ.

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(iii) බෞද්ධයාගේ අත්පොත හෙවත් හස්තසාර ග්‍රන්ථය සේ සැලකෙන ධම්මපදය සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයකි. ගාථා 423, වග්ග 26 කින් යුත් මෙහි සෑම ගාථා පාඨයකින්ම උපදේශයක් ලබාදීම සුවිශේෂ ය. සමාජයේ ජීවත් වන විට විවිධ චර්යාවන් ඇති මිනිසුන් හමු වේ. එකිනෙකා කෙරෙහි වෛරයෙන් සිටින්නවූ ද හමුවේ. ඒ සියලු දේ හමුවේ ඉතා බුද්ධිමත් ව ක්‍රියා කළ යුතු ය. ''උට්ඨානවතො සතිමතො....'' යන ගාථාවට අනුව උත්සහය පෙරටු කරගෙන ගුණ නුවණින් ක්‍රියා කර ජීවිතය ජයගන්නා ආකාරය මෙන්ම මෙලොවදීම යසස දියුණු වීම හා පී්‍රතිමත් ජීවිතයක් ගත කළ යුතු ආකාරය කියැවේ. එමෙන්ම ''අචරිත්වා බ්‍රහ්මචරියං'' ගාථා යුගලයට අනුව තරුණ කාලයේ මහන්සියෙන් වැඩ කළහොත් සැදෑ සමයේ පසුතැවිලි නොවී ප්‍රීතිමත්ව සිටිය හැකි ය. මෙවැනි උපදේශ ගණනාවක් ධම්මපදය අධ්‍යයනය කිරීමෙන් ලබාගත හැකි ය.

(ලකුණු 2 + 3 + 5 = 10)

(04) (i) දුක්ඛ ආර්ය සත්‍යය - දුක

දුක්ඛ සමුදය ආර්ය සත්‍ය - දුකට හේතුව

දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය - දුක නැති කිරීම

දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය - දුක නැති කිරීමේ මාර්ගය

(ii) <u>දුක්ඛ ආර්ය සත්‍යය</u>

දම්සක් පැවතුම් සූත්‍රයට අනුව ඉපදීම (ජාති) / වයසට යාම (ජරා / ලෙඩවීම (ව්‍යාධි / මරණ / ප්‍රියයන්ගෙන් වෙන්වීම අප්‍රියයන් හා එක්වීම / කැමති දේ නොලැබීම / පංච උපාදනස්කන්ධයම දුකකි.

<u>දුක්ඛ සමුදය ආර්ය සත්‍යය</u>

දුකට හේතුවයි. එනම් තණ්හාව ය. එය ත්‍රිවිධාකාර ය. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යනුවෙනි.

<u>දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය</u>

සසර දුකට හේතුවන තණ්හාව නැති කිරීමයි. ගසක් කපන විට මුලින් ම කපා දමන්නා සේ තණ්හාව ද සහමුලින් ම නැති කල යුතු ය.

<u>දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය</u>

දුක නැතිකිරීමේ මාර්ගයයි. එනම් මධ්‍යම ප්‍රතිපදාව මැදුම් පිළිවෙත හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කෙටියෙන් විස්තර කළ යුතුය.

(iii) සිව්සස් ලෙස හඳුන්වන චතුරාර්ය සත්‍යය තුළින් එදිනෙදා මුහුණ දෙන ගැටලු, ගැටලුවට හේතු, ගැටලුව නැති කිරීම, ගැටලුව නැති කිරීමේ මාර්ගය හඳුනාගත හැකිය. මතු වූ ගැටලුවට හේතුව මුලින්ම සොයා බලා එය හඳුනාගෙන එය නැති කිරීමට කටයුතු කළ යුතු ය. හේතුව නැති කිරීම සඳහා සුදුසු නිවැරදි මාර්ගය හඳුනාගෙන එය අනුගමනය කරමින් ඒ තුළින් ගැටලුකාරී තත්ත්වයන් ඇති නොවීමට වගබලා ගත යුතු ය. (ගැටලුවක් උදාහරණ සහිතව ලියා ඇත්නම්) මේ අනුව දෛනික ජීවිතයේ ගැටලු විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය බෙහෙවින් උපකාරි කරගත හැකි ය.

(ලකුණු 2 + 3 + 5 = 10)

(05) (i) 1 - බරණැස ඉසිපතනාරාමය

2, 3, 4 - රජගහනුවර වේළුවනාරාමය

5 - විශාලා මහනුවර කූඨාගාර ලෙන

6 - මකුල පර්වතය

8 - භේෂකලා වනය

10 - පාරිලෙය වනය

13, 18, 19 දාලිය පර්වතය

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(ii) ස්වාභාව සෞන්දර්යෙන් අනූන වූ උරුවේලාවේ සුන්දර බව අරියපරියේසන සූත්‍රයේ වර්ණනා කර ඇත. ''උරුවෙල් දනව්වේ සේනානි ගම් පියස සුන්දර වනරොදකින් සමන්විත අතර සුදුවැලි තලාවෙන් සමලංකෘතය..'' රජගහ නුවර අවට පරිසරය බුදුන් වහන්සේ වර්ණනා කළහ. ''රජගහ නුවර සිත් අලවන සුළුය. නිග්‍රෝධය සිත්කලුය...'' මහා පරිණිබ්බාණ සූත්‍රයේ විශාලා මහනුවර වර්ණනා කළහ. ''ආනන්දය, උදේනි චෛත්‍ය, ගෝතමක චෛත්‍ය, සාරන්දද චෛත්‍ය, රමණීයයි....''

එමෙන් ම වස්කාල ගත කරන විට දම්සභා මණ්ඩප තෝරාගත් විට පරිසරය ආශ්‍රිත ස්ථාන තෝරාගෙන ඇත. අනිමිස ලෝචන පූජාවෙන් පරිසරය කෙරෙහි කළගුණ දක්වා ඇත.

(iii) මිනිසා සැබවින්ම පරිසර හිතකාමී විය යුතු ය. අප අවට පරිසරය හා සියලු සම්පත් මිනිසාගේ යහපැවැත්මට හේතු වේ. එම නිසා අප ඒවා ආරක්ෂා කර ගත යුතු ය. බුදු දහම තුළ ද අවධාරණය කරනුයේ පරිසරය හා පාරිසරික සම්පත් රැක ගැනීමට මිනිසුන් දැනගත යුතු බවයි. <u>ජල සම්පත</u> රැක ගැනීමට නම්, ජලයට මුත්‍රා නොකිරීම, කෙළ නොගැසීම, අපද්‍රව්‍ය බැහැර නොකළ යුතු ය. පිරිසිදු ජලය පානය කිරීමෙන් නිරෝගී සුවය ලැබේ. ගස් කොළන් කඩා බිඳ දැමීමෙන් වැළකී ඒවා ආරක්ෂා කරගත යුතු බව චුල්ලවග්ග පාලියේ ඇත. <u>පිරිසිදු වාතය</u> අපගේ යහපැවැත්මට ප්‍රයෝජනවත් වන නිසා වාහන දුම්, කාර්මාන්ත ශාලාවලින් පිටවන විෂ වායුවලින් ඕසෝන් ස්ථරය ආරක්ෂා කර ගත යුතු ය. <u>තුරුලතා</u> රෝපණය කරමින් සොඳුරු වටපිටාවක් නිර්මාණය කළ හැකි ය. වන සම්පත් විනාශ වීමෙන් වර්ෂාව නොමැතිව කෘතිම වැසි ලබාගැනීමට සිදුවේ. රුක් රෝපණයෙන් වර්ෂාව ලැබෙන නිසා තෙතමනය රඳවා ගත හැකි ය. පිරිසිදු ජලය, පිරිසිදු වාතය මගින් යහපත් කායික, මානසික සෞඛ්‍යයක් ගොඩනගා ගත හැකිය.

(ලකුණු 2 + 3 + 5 = 10)

(06) (i) සුභද්‍ර භික්ෂුවගේ නුසුදුසු ප්‍රකාශය ''ඇවැත්නි ශෝක නොවන්න. නොවැළපෙන්න. ඒ මහා ශ්‍රමණයාගෙන් අප මිදුණෙමු. මෙය කැපය, මෙය අකැපය කීමට කිසිවෙක් නොමැත. අපට කැමති දෙයක් කළ හැකි ය.''

(ii) රාජානුග්‍රහය - අජාසත් රජු

මූලිකත්වය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ

ස්ථානය - රජගහ නුවර ගිජ්ඣකුට පර්වතය අසල වේභාර කඳුවැටිය පාමුල පිහිටි සප්තපර්ණී ගුහාව

(iii) ධර්මය හා විනය ආරක්ෂා කිරීමට පළමු ධර්ම සංගායනයෙන් වූ මෙහෙය අප්‍රමාණ ය. ධර්මය හා විනට සජ්ඣායනා කර භාණකවරුන්ට කටපාඩමින් ගෙන යාමට පැවරුණි. එහි සූත්‍ර පිටකය කොටස් 5 කට බෙදී ය. දීඝ නිකාය (ආනන්ද හිමිගේ ශිෂ්‍ය පරපුර), මජ්ඣිම නිකාය (සැරියුත් හිමිගේ ශිෂ්‍ය පරපුර), සංයුක්ත නිකාය (මහා කාශ්‍යප හිමිගේ ශිෂ්‍ය පරපුර), අංගුත්තර නිකාය (අනුරුද්ධ හිමිගේ ශිෂ්‍ය පරපුර), ඛුද්දක නිකාය (සියලු භික්ෂූන්ට) යනුවෙන් භාණකවරුන්ට පැවරී ය.

විනය පිටකය ද කොටස් 5 කට බෙදා උපාලි හිමිගේ ශිෂ්‍ය පරපුරට ලබාදුනි. පාරාජිකා පාලි, පාචිත්තිය පාලි, පරිවාර පාලි, මහා වග්ග පාලි, චුල්ල වග්ග පාලි යනුවෙනි. එමෙන් ම බුදුරදුන් දේශනා කළ විනය නීති වෙනස් නොකර රැක ගැනීම, සුභද්‍ර වැනි දුර්මතධාරී භික්ෂූන්ට ක්‍රියාත්මක වීමට නොදීම, බුදු දහම පිළිබඳ දුර්මත ඉවත් කරලීම ආදිය සිදුවිය. මෙවැනි කරුණු තුළින් ප්‍රථම ධර්ම සංගායනය ධර්ම විනය සුරක්ෂිත කිරීමට කටයුතු කර ඇති බව කිය හැකි ය.

(ලකුණු 2 + 3 + 5 = 10)

(07) (i) දුටුගැමුණු මහ රජතුමා

මාගම රාජධානිය කරගෙන බලයට පත් දුටුගැමුණු රජු ශ්‍රී ලංකාව එක්සේසත් කළ රාජ්‍ය පාලකයෙකි. කාවන්තිස්ස රජුගේ හා විහාර මහා දේවියගේ වැඩිමහල් පුත්‍රයා වූ අතර සද්ධාතිස්ස සහෝදරයා විය. ''මාගේ මේ ව්‍යායාමය රජසැප පිනිස නොව බුදු සසුනේ චිරස්ථිතිය පිණිසයි'' යන සටන් පාඨය පෙරදැරිව එළාර රජු හා සටන් කර අනුරාධපුරයේ බලයට පත් විය. රුවන්වැලි සෑය, මිරිසවැටිය, ලෝවාමහාපාය ඉදිකළ අතර කෘෂිකර්මයේ දියුණුවට මහත් සේවයක් කළේ ය. පිං පොතක් ද රචනා කළ දුටුගැමුණු රජු මෙරට ශ්‍රේෂ්ඨ පාලකයෙකි.

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(ii) සමථ භාවනාව

''චිත්තං සමේතිති සමතො'' සිත සංසුන් කරන්නේ සමථයයි. බුදු දහමේ ප්‍රධාන භාවනාවක් වන සමථ භාවනාවෙන් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන පංච නීවරණ යටපත් කර සිත සංසුන් කරයි. චිත්ත භාවනා, සමාධි භාවනා යන නම් භාවිත වේ. මෙම භාවනාවේ රාග, ද්වේශ, මෝහ, සද්ධා, බුද්ධි, විතක්ක ලෙස පුද්ගල චරිත 6 ක් කර්මස්ථාන 40 ක් ලබාගත හැකි ය. සමථ භාවනාවේ උසස්ම ප්‍රතිඵලය පංච අභිඥා අෂ්ඨසමාපත්තියයි. එය අසිත හෙවත් කාලදේව තවුසා ලබාගෙන ඇත. ධාරණ ශක්තිය වර්ධනය, කායික රෝග අඩුවීම, සිතේ සතුටක් ඇතිවීම සමථ භාවනාවෙන් ලැබිය හැකි ප්‍රයෝජනයන් ය.

(iii) ත්‍රිලක්‍ෂණය

බුදු දහමේ මූලික ඉගැන්වීම් අතර ප්‍රමුඛතම ඉගැන්වීමකි. අනිත්‍ය, දුක්ක, අනාත්ම යනු ත්‍රිලක්ෂණයයි. අනිත්‍ය යනු ස්ථිර නැත, නිත්‍ය නැත යන්නයි. අස්ථිර වූ සෑම දෙයක්ම දුක්ඛ ලක්ෂණයෙන් පෙන්වා දී ඇත. අනිත්‍ය දුක්ඛ වූ කිසි දෙයක් මමය මගේය යැයි ගත නොහැකි බව අනාත්ම ලක්‍ෂණයයි.

(iv) සඳකඩ පහණ

බෞද්ධ සිද්ධස්ථානයක දොරටුව අභියස ඇති අර්ධ කවාකාර ගල් පුවරුව සඳකඩ පහණ ය. (අඩ්ඪචන්ද පාසාණ) අනුරාධපුර යුගයේ සිටම සඳකඩ පහන් දැකගත හැකි ය. සඳකඩ පහනේ පලාපෙති මෝස්තරයක් (ගිනිදැල්), නෙළුම් මලක අර්ධයක්, ඇත් අස් ගව සිංහ යන එකා පිටුපසින් ගමන් කරන සතුන් 4 දෙනා, ලියවැලක්, නෙළුඹ් පොහොට්ටු තුඩින් ගත් හංස පේළියක් ආදී කැටයම් ඇත. රජරට සමයට අයත් කලාත්මක සඳකඩ පහණ අනුරාධපුර බිසෝ මාළිගයේ ඉදිරිපිටින් හමුවේ. පොළොන්නරු යුගයේ සඳකඩ පහණින් ගවයා ඉවත් වූයේ හින්දු ආගමේ බලපෑම මත ය. සෙනරත් පරණවිතාණ මහතා සඳකඩ පහණින් භව චක්‍රය නිරූපණය වන බව පෙන්වා දෙයි.

(ලකුණු 5 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(3) | 3 -(2) | 4 -(3) | 5 -(1) | 6 -(4) | 7 -(2) | 8 -(1) | 9 -(3) | 10 -(4) |
| 11-(2) | 12 -(1) | 13 -(3) | 14 -(4) | 15 -(2) | 16 -(1) | 17 -(3) | 18 -(4) | 19 -(2) | 20 -(3) |
| 21-(4) | 22 -(1) | 23 -(2) | 24 -(3) | 25 -(1) | 26 -(4) | 27 -(2) | 28 -(3) | 29 -(4) | 30 -(1) |
| 31-(3) | 32 -(2) | 33 -(1) | 34 -(2) | 35 -(4) | 36 -(3) | 37 -(1) | 38 -(2) | 39 -(3) | 40 -(4) |

## II කොටස

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

01. (i) අසිත හෙවත් කාලදේවල තවුසා

(ii) ''මේ මාගේ අවසන් උපතය. නැවත උපතක් නැත.''

(iii) මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිණියක්, පැවිදි රුවක්

(iv) සමථ භාවනාව / විපස්සනා භාවනාව

(v) ගඟක් පහළට ගලායන්නාසේ මිනිසුන් රාගයෙන් රාගයට, ද්වේශයෙන් ද්වේශයට, මෝහයෙන් මෝහයට ගමන් කිරීම.

(vi) දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව

(vii) අලෝභ, අදෝස, අමෝහ

(viii) ''මෙය නැති කල්හි මෙය නොවේ - මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි.''

(ix) රාග චරිත, ද්වේශ චරිත, මෝහ චරිත, සද්ධා චරිත, බුද්ධි චරිත, විතක්ක චරිත

(x) රුවන්වැලි සෑය / මිරිසවැටිය (ලකුණු 2 × 10 = 20)

(02) (i) නැගෙනහිර - මාපිය, දූදරු උඩ දිශාව - ගිහි, පැවිදි

(ii) දරුවන්ගෙන් දෙමාපියන්ට

* මවුපියන් පෝෂණය කිරීම.
* ඔවුන්ගේ කටයුතු සොයාබලා ඉටුකර දීම.
* දෙමාපියන් රැගෙන ආ කුල පරපුර ආරක්ෂා කිරීම.
* දෙමාපියන්ගෙන් හිමි වූ දේ රැක ගැනීම.
* මවුපියන් පරලොව ගිය පසු පින් අනුමෝදන් කරවීම.

(iii) සිගාලෝවාද සූත්‍රයේ දකුණු දිශාවෙන් ගුරු ශිෂ්‍ය යුතුකම් දක්වා ඇත. එසේ ගුරුවරු දකුණු දිශාවට සමාන කර දක්වා ඇත්තේ ශිෂ්‍යයන්ගේ පුද සැලකිලි ලැබීමට සුදුසු වන හෙයින් ය. ගුරුවරයාගෙන් ශිෂ්‍යාටත් ශිෂ්‍යාගෙන් ගුරුවරයාටත් යුතුකම් ඉටුවීම තුළින් පරමාදර්ශී සමාජයක් බිහිවීමට මඟ පෑදේ. ශිෂ්‍යයන් තම ගුරුවරුන් කෙරෙහි විශ්වාසයෙන් ඇල්මකින් ක්‍රියා කළ යුතු ය. ඉගෙනීම ඉතා ඕනෑකමින් උනන්දුවෙන් කළ යුතු ය. ශිෂ්‍යයන කෙරෙහි ගුරුවරයා ද දයාවෙන්, කරුණාවෙන් ක්‍රියා කළ යුතු ය. ශිෂ්‍යයන්ගේ සුළු වරදක් දුටු විට කලකිරීමට පත් නොවී ඔවුනගේ යහපත සඳහා ක්‍රියා කළ යුතු ය. මෙසේ ක්‍රියා කරන විට අන්‍යෝන්‍ය සබඳතාව වර්ධනය වී එය පරමාදර්ශී සමාජයක් බිහි කිරීමට මඟ පාදයි.

(ලකුණු 2 + 3 + 5 = 10)

(03) (i) උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්මජීවිනෝ
අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති

(ii) උත්සහවන්ත, මනා සිහිය ඇති නිවැරදි දේ පරීක්ෂාවෙන් හික්මීමෙන්, දැහැමිව ජීවත් වන තැනැත්තාගේ යසස වැඩේ.

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(iii) බෞද්ධයාගේ අත්පොත හෙවත් හස්තසාර ග්‍රන්ථය සේ සැලකෙන ධම්මපදය සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයකි. ගාථා 423, වග්ග 26 කින් යුත් මෙහි සෑම ගාථා පාඨයකින්ම උපදේශයක් ලබාදීම සුවිශේෂ ය. සමාජයේ ජීවත් වන විට විවිධ චර්යාවන් ඇති මිනිසුන් හමු වේ. එකිනෙකා කෙරෙහි වෛරයෙන් සිටින්නවුද හමුවේ. ඒ සියලු දේ හමුවේ ඉතා බුද්ධිමත් ව ක්‍රියා කළ යුතු ය. ''උට්ඨානවතො සතිමතො....'' යන ගාථාවට අනුව උත්සහය පෙරටු කරගෙන ගුණ නුවණින් ක්‍රියා කර ජීවිතය ජයගන්නා ආකාරය මෙන්ම මෙලොවදීම යසස දියුණු වීම හා පී්‍රතිමත් ජීවිතයක් ගත කළ යුතු ආකාරය කියැවේ. එමෙන්ම ''අචරිත්වා බ්‍රහ්මචරියං'' ගාථා යුගලයට අනුව තරුණ කාලයේ මහන්සියෙන් වැඩ කළහොත් සැදෑ සමයේ පසුතැවිලි නොවී ප්‍රීතිමත්ව සිටිය හැකි ය. මෙවැනි උපදේශ ගණනාවක් ධම්මපදය අධ්‍යයනය කිරීමෙන් ලබාගත හැකි ය.

(ලකුණු 2 + 3 + 5 = 10)

(04) (i) දුක්ඛ ආර්ය සත්‍යය - දුක

දුක්ඛ සමුදය ආර්ය සත්‍ය - දුකට හේතුව

දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය - දුක නැති කිරීම

දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය - දුක නැති කිරීමේ මාර්ගය

(ii) <u>දුක්ඛ ආර්ය සත්‍යය</u>

දම්සක් පැවතුම් සූත්‍රයට අනුව ඉපදීම (ජාති) / වයසට යාම (ජරා / ලෙඩවීම (ව්‍යාධි / මරණ / ප්‍රියයන්ගෙන් වෙන්වීම අප්‍රියයන් හා එක්වීම / කැමති දේ නොලැබීම / පංච උපාදනස්කන්ධයම දුකකි.

<u>දුක්ඛ සමුදය ආර්ය සත්‍යය</u>

දුකට හේතුවයි. එනම් තණ්හාව ය. එය ත්‍රිවිධාකාර ය. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා යනුවෙනි.

<u>දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය</u>

සසර දුකට හේතුවන තණ්හාව නැති කිරීමයි. ගසක් කපන විට මුලින් ම කපා දමන්නා සේ තණ්හාව ද සහමුලින් ම නැති කල යුතු ය.

<u>දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය</u>

දුක නැතිකිරීමේ මාර්ගයයි. එනම් මධ්‍යම ප්‍රතිපදාව මැදුම් පිළිවෙත හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කෙටියෙන් විස්තර කළ යුතුය.

(iii) සිව්සස් ලෙස හඳුන්වන චතුරාර්ය සත්‍යය තුළින් එදිනෙදා මුහුණ දෙන ගැටලු, ගැටලුවට හේතු, ගැටලුව නැති කිරීම, ගැටලුව නැති කිරීමේ මාර්ගය හඳුනාගත හැකිය. මතු වූ ගැටලුවට හේතුව මුලින්ම සොයා බලා එය හඳුනාගෙන එය නැති කිරීමට කටයුතු කළ යුතු ය. හේතුව නැති කිරීම සඳහා සුදුසු නිවැරදි මාර්ගය හඳුනාගෙන එය අනුගමනය කරමින් ඒ තුළින් ගැටලුකාරී තත්ත්වයන් ඇති නොවීමට වගබලා ගත යුතු ය. (ගැටලුවක් උදාහරණ සහිතව ලියා ඇත්නම්) මේ අනුව දෛනික ජීවිතයේ ගැටලු විසඳා ගැනීමට චතුරාර්ය සත්‍යය බෙහෙවින් උපකාරි කරගත හැකි ය.

(ලකුණු 2 + 3 + 5 = 10)

(05) (i) 1 - බරණැස ඉසිපතනාරාමය

2, 3, 4 - රජගහනුවර වේළුවනාරාමය

5 - විශාලා මහනුවර කූටාගාර ලෙන

6 - මකුල පර්වතය

8 - භේෂකලා වනය

10 - පාරිලෙය වනය

13, 18, 19 දාලිය පර්වතය

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(ii) ස්වාභාව සෞන්දර්යෙන් අනූන වූ උරුවේලාවේ සුන්දර බව අරියපරියේසන සූත්‍රයේ වර්ණනා කර ඇත. ''උරුවෙල් දනව්වේ සේනානි ගම් පියස සුන්දර වනරොදකින් සමන්විත අතර සුදුවැලි තලාවෙන් සමලංකෘතය..'' රජගහ නුවර අවට පරිසරය බුදුන් වහන්සේ වර්ණනා කළහ. ''රජගහ නුවර සිත් අලවන සුළුය. නිග්‍රෝධය සිත්කලුය...'' මහා පරිණිබ්බාණ සූත්‍රයේ විශාලා මහනුවර වර්ණනා කළහ. ''ආනන්දය, උදේනි චෛත්‍ය, ගෝතමක චෛත්‍ය, සාරන්දද චෛත්‍ය, රමණීයයි....''

එමෙන් ම වස්කාල ගත කරන විට දම්සභා මණ්ඩප තෝරාගත් විට පරිසරය ආශ්‍රිත ස්ථාන තෝරාගෙන ඇත. අනිමිස ලෝචන පූජාවෙන් පරිසරය කෙරෙහි කළගුණ දක්වා ඇත.

(iii) මිනිසා සැබවින්ම පරිසර හිතකාමී විය යුතු ය. අප අවට පරිසරය හා සියලු සම්පත් මිනිසාගේ යහපැවැත්මට හේතු වේ. එම නිසා අප ඒවා ආරක්ෂා කර ගත යුතු ය. බුදු දහම තුළ ද අවධාරණය කරනුයේ පරිසරය හා පාරිසරික සම්පත් රැක ගැනීමට මිනිසුන් දැනගත යුතු බවයි. <u>ජල සම්පත</u> රැක ගැනීමට නම්, ජලයට මුත්‍රා නොකිරීම, කෙළ නොගැසීම, අපද්‍රව්‍ය බැහැර නොකළ යුතු ය. පිරිසිදු ජලය පානය කිරීමෙන් නිරෝගී සුවය ලැබේ. ගස් කොළන් කඩා බිඳ දැමීමෙන් වැළකී ඒවා ආරක්ෂා කරගත යුතු බව චුල්ලවග්ග පාලියේ ඇත. <u>පිරිසිදු වාතය</u> අපගේ යහපැවැත්මට ප්‍රයෝජනවත් වන නිසා වාහන දුම්, කාර්මාන්ත ශාලාවලින් පිටවන විෂ වායුවලින් ඕසෝන් ස්ථරය ආරක්ෂා කර ගත යුතු ය. <u>තුරුලතා</u> රෝපණය කරමින් සොදුරු වටපිටාවක් නිර්මාණය කළ හැකි ය. වන සම්පත් විනාශ වීමෙන් වර්ෂාව නොමැතිව කෘතිම වැසි ලබාගැනීමට සිදුවේ. රුක් රෝපණයෙන් වර්ෂාව ලැබෙන නිසා තෙතමනය රඳවා ගත හැකි ය. පිරිසිදු ජලය, පිරිසිදු වාතය මගින් යහපත් කායික, මානසික සෞඛ්‍යයක් ගොඩනගා ගත හැකිය.

(ලකුණු 2 + 3 + 5 = 10)

(06) (i) සුභද්‍ර භික්ෂුවගේ නුසුදුසු ප්‍රකාශය ''ඇවැත්නි ශෝක නොවන්න. නොවැළපෙන්න. ඒ මහා ශ්‍රමණයාගෙන් අප මිදුණෙමු. මෙය කැපය, මෙය අකැපය කීමට කිසිවෙක් නොමැත. අපට කැමති දෙයක් කළ හැකි ය.''

(ii) රාජානුග්‍රහය - අජාසත් රජු

මූලිකත්වය - මහා කාශ්‍යප මහරහතන් වහන්සේ

ස්ථානය - රජගහ නුවර ගිජ්ඣකූට පර්වතය අසල වේභාර කඳුවැටිය පාමුල පිහිටි සප්තපර්ණී ගුහාව

(iii) ධර්මය හා විනය ආරක්ෂා කිරීමට පළමු ධර්ම සංගායනයෙන් වූ මෙහෙය අප්‍රමාණ ය. ධර්මය හා විනට සජ්ඣායනා කර භාණකවරුන්ට කටපාඩමින් ගෙන යාමට පැවරුණි. එහි සූත්‍ර පිටකය කොටස් 5 කට බෙදී ය. දීඝ නිකාය (ආනන්ද හිමිගේ ශිෂ්‍ය පරපුර), මජ්ඣිම නිකාය (සැරියුත් හිමිගේ ශිෂ්‍ය පරපුර), සංයුක්ත නිකාය (මහා කාශ්‍යප හිමිගේ ශිෂ්‍ය පරපුර), අංගුත්තර නිකාය (අනුරුද්ධ හිමිගේ ශිෂ්‍ය පරපුර), ඛුද්දක නිකාය (සියලු භික්ෂූන්ට) යනුවෙන් භාණකවරුන්ට පැවරී ය.

විනය පිටකය ද කොටස් 5 කට බෙදා උපාලි හිමිගේ ශිෂ්‍ය පරපුරට ලබාදුනි. පාරාජිකා පාලි, පාචිත්තිය පාලි, පරිවාර පාලි, මහා වග්ග පාලි, චුල්ල වග්ග පාලි යනුවෙනි. එමෙන් ම බුදුරදුන් දේශනා කළ විනය නීති වෙනස් නොකර රැක ගැනීම, සුභද්‍ර වැනි දුර්මතධාරී භික්ෂූන්ට ක්‍රියාත්මක වීමට නොදීම, බුදු දහම පිළිබඳ දුර්මත ඉවත් කරලීම ආදිය සිදුවිය. මෙවැනි කරුණු තුළින් ප්‍රථම ධර්ම සංගායනය ධර්ම විනය සුරක්ෂිත කිරීමට කටයුතු කර ඇති බව කිය හැකි ය.

(ලකුණු 2 + 3 + 5 = 10)

(07) (i) දුටුගැමුණු මහ රජතුමා

මාගම රාජධානිය කරගෙන බලයට පත් දුටුගැමුණු රජු ශ්‍රී ලංකාව එක්සේසත් කළ රාජ්‍ය පාලකයෙකි. කාවන්තිස්ස රජුගේ හා විහාර මහා දේවියගේ වැඩිමහල් පුත්‍රයා වූ අතර සද්ධාතිස්ස සහෝදරයා විය. ''මාගේ මේ ව්‍යායාමය රජසැප පිනිස නොව බුදු සසුනේ චිරස්ථිතිය පිණිසයි'' යන සටන් පාඨය පෙරදැරිව එළාර රජු හා සටන් කර අනුරාධපුරයේ බලයට පත් විය. රුවන්වැලි සෑය, මිරිසවැටිය, ලෝවාමහාපාය ඉදිකළ අතර කෘෂිකර්මයේ දියුණුවට මහත් සේවයක් කළේ ය. පිං පොතක් ද රචනා කළ දුටුගැමුණු රජු මෙරට ශ්‍රේෂ්ඨ පාලකයෙකි.



(4) WWW.PastPapers.WiKi (3)
Download Term Test Papers, Short Notes From One Place!

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

(ii) සමථ භාවනාව

"චිත්තං සමේතිතී සමතො" සිත සංසුන් කරන්නේ සමථයයි. බුදු දහමේ ප්‍රධාන භාවනාවක් වන සමථ භාවනාවෙන් කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන පංච නීවරණ යටපත් කර සිත සංසුන් කරයි. චිත්ත භාවනා, සමාධි භාවනා යන නම් භාවිත වේ. මෙම භාවනාවේ රාග, ද්වේශ, මෝහ, සද්ධා, බුද්ධි, විතක්ක ලෙස පුද්ගල චරිත 6 ක් කර්මස්ථාන 40 ක් ලබාගත හැකි ය. සමථ භාවනාවේ උසස්ම ප්‍රතිඵලය පංච අභිඥා අෂ්ඨසමාපත්තියයි. එය අසිත හෙවත් කාලදේව තවුසා ලබාගෙන ඇත. ධාරණ ශක්තිය වර්ධනය, කායික රෝග අඩුවීම, සිතේ සතුටක් ඇතිවීම සමථ භාවනාවෙන් ලැබිය හැකි ප්‍රයෝජනයන් ය.

(iii) ත්‍රිලක්ෂණය

බුදු දහමේ මූලික ඉගැන්වීම් අතර ප්‍රමුඛතම ඉගැන්වීමකි. අනිත්‍ය, දුක්ක, අනාත්ම යනු ත්‍රිලක්ෂණයයි. අනිත්‍ය යනු ස්ථිර නැත, නිත්‍ය නැත යන්නයි. අස්ථිර වූ සෑම දෙයක්ම දුක්ඛ ලක්ෂණයෙන් පෙන්වා දී ඇත. අනිත්‍ය දුක්ඛ වූ කිසි දෙයක් මමය මගේය යැයි ගත නොහැකි බව අනාත්ම ලක්ෂණයයි.

(iv) සඳකඩ පහණ

බෞද්ධ සිද්ධස්ථානයක දොරටුව අභියස ඇති අර්ධ කවාකාර ගල් පුවරුව සඳකඩ පහණ ය. (අඩ්ඩචන්ද පාසාණ) අනුරාධපුර යුගයේ සිටම සඳකඩ පහන් දැකගත හැකි ය. සඳකඩ පහනේ පලාපෙති මෝස්තරයක් (ගිනිදැල්), නෙළුම් මලක අර්ධයක්, ඇත් අස් ගව සිංහ යන එකා පිටුපසින් ගමන් කරන සතුන් 4 දෙනා, ලියවැලක්, නෙළුඹ පොහොට්ටු තුඩින් ගත් හංස පේළියක් ආදී කැටයම් ඇත. රජරට සමයට අයත් කලාත්මක සඳකඩ පහණ අනුරාධපුර බිසෝ මාළිගයේ ඉදිරිපිටින් හමුවේ. පොළොන්නරු යුගයේ සඳකඩ පහණින් ගවයා ඉවත් වූයේ හින්දු ආගමේ බලපෑම මත ය. සෙනරත් පරණවිතාණ මහතා සඳකඩ පහණින් භව චක්‍රය නිරූපණය වන බව පෙන්වා දෙයි.

(ලකුණු 5 + 5 = 10)


PAST PAPERS WIKI
(4) WWW.PastPapers.WiKi (4)
Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
ඉතිහාසය
2013 - 2022
සංගීතය
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න